**ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**
**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැකිය. තවද, මේ හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කලයුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණකාධිකාරීවරයාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මෙම වැය ශීර්ෂය යටතේ වන මූල්‍ය ප්‍රකාශන තොරතුරු අවසන් භාණ්ඩාගාර ගිණුම් සමඟ සැසඳීමේදී වාර්ෂික වියදමෙහි රු.24,318,095 ක වෙනසක් නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය පිළියෙල කිරීමේදි 2018 වර්ෂයේ සැලකිල්ලට ගනු ලැබුවේ මෙම දෙපාර්තමේන්තුව විසින් දරණ ලද වියදම් පමණි. අංක 267/2018 දරන නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සඳහා තොරතුරු ලබා ගනු ලැබුවේ දී ඇති උපදෙස් අනුව වේ. |
| (ආ) | ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශනවල දෙපාර්තමේන්තු වැය ශීර්ෂයට අයත් නොවන ශීර්ෂ අංක 193 සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන රු.3,733,000 ක් හා එම වැය ශීර්ෂයට අදාල වර්ෂයේ වියදම වූ රු.2,878,052 ක් ද ඇතුලත් කර තිබුණි. එම නිසා ශීර්ෂයට අදාල නිවැරදි වියදම මූල්‍ය ප්‍රකාශන මගින් පෙන්නුම් කර නොතිබුණි. තවද මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දරන ලද රු.661,445 ක වියදම්ද මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කර නොතිබුණි. | - එම - | මූල්‍ය ප්‍රකාශයේ ඒසීඒ2(ii) ආකෘතියේ තීරු අංක 6 හි දක්වා ඇති 328-1-1-2509 වැය ශීර්ෂයන්හි වියදම් නිවැරදිව තීරු අංක 6 හි දක්වා නොමැති බව පිළිගනිමි. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි සෑම මාසයකම නැවත පරික්ෂා කිරීමට හැකි ආකාරයට පොත් පත් නිවැරදි කර ඇත. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීවරයාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් වැය කිරීම් | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | පුනරාවර්තන වියදම්වලින් හරස් සටහන් මගින් දරණ ලද වියදම වූ රු. 13,067,702 ක් අඩු කරන ලදි. එය මුදලින් දැරීමක් නොවන බැවින් එසේ අඩුකර මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර ඇත. |

| | |
|---|---|
| රු.11,761,187 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | මුලධන වියදම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගෙන ඇත්තේ සත්‍ය වශයෙන්ම මෙම දෙපාර්තමේන්තුව විසින් මුදලින් දරණ ලද වියදම පමණි. එනම් රු.22,703,625 කි. වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් දරණ ලද වියදම රු.3,275,910 කි. මෙය සුනිසි මෙහෙවර සඳහා කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශයෙන් ලබා දෙන ලද ප්‍රතිපාදන මත වැය දැරීමකි. එහිදි දක්වා ඇති වෙනස වූ රු.107,671 ක මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බි ගිණුමට බැර කරන ලද මුදලකි. මෙය මුදල් ගලා යැමක් නොවන නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගෙන නැත. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරියා විසින් සිදු කල යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතුය. එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කිරිම සඳහා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය වෙත භාර දී ඇත. එය ඉදිරියේදි නිකුත් කිරිමට නියමිත අතර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට ද කටයුතු යොදා ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මු.රෙ. 94 (1) ප්‍රකාරව යම් වැය විෂයයක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන පවතින්නේ නම් පමණක් බැරකම් සඳහා එළඹිය හැකි වුවත් දෙපාර්තමේන්තුව විසින් වර්ෂයේ ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු.4,631,438 ක බැරකම් සඳහා එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම්වලට එළඹීමට ප්‍රථම ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන පවතීද යන්න පිළිබඳ සැලකිලිමත් විය යුතුය. | ඇස්තමේන්තු කෙටුම් පත් සකස් කිරීමේදී අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන ඉදිරිපත් කලත් ඒවා අනුමත විමේදි ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා නොදෙන බැවින් මෙලෙස බැරකම්වලට බැදීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. |
| (ආ) 2018 වර්ෂයේදී අංක 328-1-1404 දරණ වැය විෂයය යටතේ 2017 වර්ෂය වෙනුවෙන් රු.5,492,676 ක බැරකමක් නිරවුල් කර තිබුණද, ඉකුත් වර්ෂයේ විසර්ජන ගිණුමෙහි එම වැය විෂයය යටතේ බැරකම් ලෙස රු.2,746,338 ක් පමණක් දක්වා තිබුණි. | බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුවීම. | 2018 වර්ෂයේ බැරකම් ලෙස රු.5,492,676 දක්වා ඇත්තේ 2018 වසර අගදී මහා භාණ්ඩාගාරයේ අක්මුදල් ලබා දීමට නොහැකි වීම මත එය බැරකම් ලෙස පෙන්වීමට සිදු වූ නිසාය. 2019 ජනවාරි හා පෙබරවාරි මාසවලද ගෙවීම් කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තියේ 371 වන පරිච්ඡේදය ප්‍රකාරව මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය අනුව අදාල අමාත්‍යාංශ වෙතින් ක්‍රියාකාරී සැලසුම් ලබාගෙන 2018 වර්ෂය වෙනුවෙන් ඒකාබද්ධ ක්‍රියාකාරී සැලසුමක් සකස් කළ යුතු | ජාතික වශයෙන් වැදගත් වන මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම රජය වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති නිසා එය ක්‍රියාවට | සංශෝධිත ප්‍රතිපත්තිය 2017 වර්ෂයේ දී අනුමත කිරීමෙන් පසුව, 2017-2019 මධ්‍ය කාලීන රාමුව සඳහා අදාළ සැලසුම් සකසා ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් ලිපි 2017 දී යවා ඇත. තවද, කම්කරු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018 වර්ෂයේදී අදාළ අමාත්‍යාංශයන්හි ක්‍රියාකාරී සැලසුම් 2018-2020 කාලසීමාව සඳහා යාවත්කාලීන කරන ලෙස දන්වන ලදී. අමාත්‍යාංශ 02ක් වෙතින් පමණක් මේ සම්බන්ධව ප්‍රගතිය ඉදිරිපත් කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | විය. එහෙත් එබඳු සැලසුමක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සකස්කර නොතිබුණි. එමෙන්ම අමාත්‍යාංශ 08 ක් වෙතින් පමණක් ක්‍රියාකාරි සැළසුම් ඉදිරිපත්කර තිබූ නමුත් එම සැලසුම් වල ප්‍රගතිය පිළිබඳ විස්තර අමාත්‍යාංශ දෙකකින් පමණක් ඉදිරිපත් කර තිබුණි. | නැංවීමට අදාල නිසි ක්‍රමවේදවලට අනුව කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේදී ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය මෙහෙයවීමේ කාර්යය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත පැවරීමට ද, මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ ජාතික මෙහෙයුම් කමිටුව ලෙස එම අමාත්‍යාංශය යටතේ වන ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය නම් කිරීමට ද යෝජනා කරන ලදී. එහෙත් ඒ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය වෙතින් ප්‍රතිචාරයක් ලැබී නොමැත. එබැවින්, 2019 වර්ෂයේ දී, මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් උද්ගතවී ඇත. |
| (ආ) | 2018 ජනවාරි මස වන විට මානව සම්පත් හා සේවා නියුක්ත ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍යාංශ සම්බන්ධීකරණ වැඩපිළිවෙල අවසන් වී තිබුණි. එහෙත් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ඉදිරි ක්‍රියාමාර්ග පැහැදිලි කරවා ගැනීමට අවශ්‍ය බව දන්වමින් විවිධ අමාත්‍යාංශ වෙතින් ලිපි ඉදිරිපත්ව තිබුණද ඔවුන්ට එම පැහැදිලි කිරීම් සිදුකල බවට සනාථන නොවුනි. එම නිසා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට හඳුනාගත් අමාත්‍යාංශවලට ඒ පිළිබඳ පැහැදිලි දැනුවත්වීමක් නොමැති බව නිරීක්ෂණය විය. | - එම - | අමාත්‍යාංශවල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් වෙත පැවරීම හා නිලධාරීන් වෙනස් වන විට අනුප්‍රාප්තිකයින් වෙත එම කාර්යයන් පවරා අප දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වේ. සම්බන්ධිත අමාත්‍යාංශ මගින් එය සිදු නොවීමෙන් මෙම තත්වය උදා වී ඇත. එම තොරතුරු යාවත්කාලීන කිරීම අදාල අමාත්‍යාංශ හා ආයතන මට්ටමින් සිදු කළ යුතු අතර ඒ පිළිබඳව කාර්යාල පටිපාටි අනුව අප දෙපාර්තමේනතුව වෙත ඔවුන් දැන්විය යුතුය. |
| (ඇ) | කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු. මිලියන 5 ක් ප්‍රතිපාදනය කර තිබුණද පද්ධතිය සංවර්ධනය කිරීමට පෙර, ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාවලි විශ්ලේෂණයක් සිදුකල යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා රු.4,925,000 කට පරිගණක 47 ක් මිලට ගෙන බෙදාහැරීම සිදුකර තිබුණු | පද්ධතිය සකස් කිරීම සඳහා වන ප්‍රතිපාදන ඵලදායී වන ආකාරයට සැලසුම් සහගතව භාවිතා කළ යුතුවීම. | 2018 වසරේදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව සමස්ථ දෙපාර්තමේන්තුව සඳහා ක්‍රියාවලි විශ්ලේෂණයක් (BA Study) සිදු කිරීමට ආයතනයක් තෝරා ගැනීම සඳහා ICTA ආයතනයේද පූර්ණ මාර්ගෝපදේශය යටතේ කටයුතු කරන ලදී. ඒ සඳහා ඉදිරිපත් වූ මිල ගණන්, වෙන් කල මුදල මෙන් කිහිප ගුණයක් වීම මත එම අවස්ථාවේ ක්‍රියාවලි විශ්ලේෂණය සිදු නොවිණි. තවද, 2018 වර්ෂයේ මැද භාගයේ සිට මේ දක්වා Google.doc මෘදුකාංග යෙදවුම භාවිතයෙන් පද්ධතියක් සංවර්ධනය කර නියමු මට්ටමින් දිස්ත්‍රික්ක 10 ක මාසික ප්‍රගති සාරාංශ ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගැනීම සිදු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | අතර 2017 වර්ෂයේදීද ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලැප්ටොප් පරිගණක 70 ක් රු.6,971,300 ක වියදමක් දරා මිලදී ගෙන තිබුණි. | මෙම සමස්ත MIS ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 117.74 ක් ඇස්තමේන්තු කර ඇත. ඒ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා තොරතුරු තාක්ෂණ/ පරිගණක ආදී කාර්යාල උපකරණ ලබා දීම සඳහා රු.මිලියන 97.5 ක්ද වෙන් කර ඇත. මේ අනුව මහා භාණ්ඩාගාරය විසින් 2017 වසරේදී හා 2018 වසරේදී ලබා දී තිබූ රු.මිලියන 15 භාවිතා කරමින් මෙම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ට නියමු මට්ටමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලැප්ටොප් 70 ක් හා පරිගණක 47 ක් ලබා දී ඇත. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය අවසානයේ අමාත්‍යාංශ වෙනස්වීම නිසා මානව සම්පත් හා සේවා නියුක්ත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව විගණනය වෙත දන්වා තිබුණි. ඒ වෙනුවෙන් සැලසුම් කල වටිනාකම රු.1,750,000 ක් වූ තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම, ප්‍රතිපත්තියේ ප්‍රගතිය අධීක්ෂණය පැවරී ඇති අංශයේ (Monitoring Unit) භෞතික සංවර්ධනය, ප්‍රතිපත්තියේ ප්‍රගතිය වාර්තා කිරීම (කාර්තුමය/ වාර්ෂික) සහ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සමුළුවක් පැවැත්වීම යන ක්‍රියාකාරකම් ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | මානව සම්පත් හා සේවා නියුක්ත ප්‍රතිපත්තියේ ජාතික වැදගත්කම සලකා එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විම සම්බන්ධීකරණයට අදාළ පරිගණක පද්ධතිය සඳහා ප්‍රසම්පාදනය කර තිබූ පරිගණක සර්වර් (Server) සුදුසු පරිදි ස්ථාපිත කිරීම සඳහා සුනිසි මෙහෙවර යටතේ ප්‍රතිපාදන වෙන් කරන ලදි. එම කාර්යය සඳහා ලෝක කම්කරු සංවිධානයේ මූල්‍ය අනුග්‍රහය ද ලැබී තිබුණි. තවද විගණන විමසුම මගින් ම දක්වා ඇති පුරෝකථනය කළ නොහැකි හේතු මත අදාළ සමුළුව පැවැත්වීමට නොහැකි වූ අතර, එමගින් ඉතිරි වූ ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳහා යොදවන ලදී. එම වසරේ අවසාන මාසවල රාජ්‍ය තන්ත්‍රයේ පැවති තත්වය මත අමාත්‍යාංශ වල ක්‍රියාකාරී වපසරිය හා රාජකාරී පැවරීම ගැටළු සහගත වූයෙන් සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට අපහසු විය. |

**3.3 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු වාහන සේවාකිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 ඡේදය ප්‍රකාරව සැපයුම්කරුවන් තෝරාගැනීමකින් තොරව එක් ආයතනයක් මගින් පමණක් සමාලෝචිත වර්ෂය පුරාම සියලු වාහන සඳහා වූ සේවා රු.492,934 ක මුදලකට සිදුකර ගෙන තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති උපදෙස් හා මගපෙන්වීම් අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුය. | වර්ෂය පුරාම දෙපාර්තමේන්තුවේ වාහන සියල්ල සේවා කිරීම සඳහා රු.492,934 ක් වැය කර ඇත. ඉදිරියේදී වාහන සේවා කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි තෝරාගත් ආයතන මගින් සිදු කිරීමට පියවර ගනු ලැබේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මානව සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට 2015 වර්ෂයේදී මිලට ගෙන තිබූ රු.8,335,000 ක් වටිනා පරිගණක දෘඩාංග හා මෘදුකාංග භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් නිශ්ක්‍රීයව නොතබා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය විසින් මෙම දෙපාර්තමේන්තුවට පවරන ලද පරිගණක දෘඩාංග අදාළ මෙහෙයුම් ඒකකයේ කාර්යයන් සඳහා වෙන් කර තැබුවද, එම ඒකකයට අවශ්‍ය කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් නොලැබුණි. එම නිසා අදාළ උපකරණ ඌණ උපයෝජනයක් සිදුව පැවතුණි. එහෙත්, මේ වනවිට අදාළ උපකරණවලින් මෙම ඒකකයට අවශ්‍ය පරිගණක උපකරණ ප්‍රමාණය රඳවාගෙන අතිරේක උපකරණ දෙපාර්තමේන්තුවේ වෙනත් ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාලයන්හි භාවිතය සඳහා යොදවා ඇත. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවය ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රම බලකාය නිසි වෘත්තීන්ට යොමු කරවීම, නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම, ජාතික ප්‍රතිපත්ති හා පුද්ගල හැකියා හා දක්ෂතාවයන්ට අනුකූල රැකියාවන් ප්‍රවර්ධනය කිරීම යන කාර්යයන් සඳහා රැකියා නිර්මාණ ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම අංශය මගින් වැඩසටහන් 773 ක් රු.3,471,406 ක වියදමින් පවත්වා තිබූ අතර ඒ සඳහා පුද්ගලයින් 23,365 ක් සහභාගී වී තිබුණි. නමුත් එම පුද්ගලයින් අතුරින් ස්වයං රැකියා සඳහා යොමු වූ පිරිස දිස්ත්‍රික්ක 25 දීම 2,753 ක් වූ අතර එය සියයට 11.78 ක් විය. මේ අතරින් කොළඹ දිස්ත්‍රික්කයේ වැඩසටහන් 31 ක් පවත්වා තිබූ අතර එයට පුද්ගලයින් 1,478 ක් සහභාගී වී තිබුණි. ඉන් 15 දෙනෙකු පමණක් ස්වයං රැකියාවලට යොමු වී තිබුණි. | දෙපාර්තමේන්තුව මගින් මහජනතාවට ඉටුවිය යුතු සේවාවන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට හැකිවන පරිදි නිවැරදි හා ප්‍රායෝගික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවීම. | මෙම වැඩසටහන් මගින් ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ කෙසේද , පවත්නා ව්‍යාපාරය වඩා සාර්ථක ලෙස ඉදිරියට ගෙන යන්නේ කුමන ආකාරයකින්ද යන්න පිළිබඳව ප්‍රතිලාභීන් හට දැනුම ලබාදීම මූලිකවම සිදුකරන අතර ඒ තුළින් සැලකිය යුතු ස්වයං රැකියා ලාභීන් ප්‍රමාණයක් බිහිකිරීමට හැකියාව ලැබී ඇත. එය ප්‍රතිශතාත්මකව බැලු කල සියයට 11.78 ප්‍රමාණයක් යනු පවතින ආර්ථික තත්වය යටතේ, එය ඉහළ මට්ටමේ සාර්ථකත්වයක් ලඟා කර ගැනීමක් ලෙස සැලකිය හැකි බව ද වැඩිදුරටත් දන්වා සිටිමි. |
| (ආ) | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන දිවයිනේ දිස්ත්‍රික් 25 තුළම ක්‍රියාත්මක වේ. රැකියා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම, පුරප්පාඩු ආයතන ලියාපදිංචි කිරීම හා රැකියා අපේක්ෂිතයින් ඒ සඳහා රැකියාගත කිරීම එම ආයතනයේ ප්‍රධාන කාර්යය වේ. 2018 වර්ෂයේදී මෙම මධ්‍යස්ථාන මගින් රැකියා අපේක්ෂකයින් 121,016 ක් ලියාපදිංචි කර තිබූ නමුත් මුළු රැකියාගත කිරීම් සංඛ්‍යාව 12,807 ක් විය. එය ලියාපදිංචි මුළු සංඛ්‍යාවෙන් සියයට 10 ක් පමණක් විය. | -එම- | යාවත්කාලීන කරන ලද තොරතුරු අනුව, 2018 වර්ෂයේදී මෙම මධ්‍යස්ථාන මගින් ලියාපදිංචි කර ඇති රැකියා අපේක්ෂකයින් සංඛ්‍යාව 131,631 වන අතර, රැකියාගත කිරීමේ සංඛ්‍යාව 13,471 වේ. රැකියා අපේක්ෂිතයන් සඳහා සංවිධානය කරනු ලබන රැකියා පොළ වැඩසටහන් සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදීමටද, එම අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සේවා ලබාදීම මගින් නිශ්චිත රැකියා ක්ෂේත්‍ර සඳහා පෙළඹවීමද, රැකියාගත වීම ප්‍රමාද වූ රැකියා අපේක්ෂිතයන් සඳහා ශ්‍රම වෙළඳපොළ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමටද ඇතුළු විවිධ වැඩසටහන් රාශියක් හරහා 2019 වර්ෂයේ |

| | | |
|---|---|---|
| | | දී එම ලියාපදිංචි රැකියා අපේක්ෂිතයින් රැකියාගත කිරීමේ ක්‍රමවේදයන් සකසා ඇත. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 හා 3 ඡේද පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩල නිපුණතා අවශ්‍යතාවයන්ද හඳුනාගෙන නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ට අදාල මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මෙම දෙපාර්තමේන්තුගතව සිට ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණය වන නිලධාරීන් පිරිස සම්බන්ධව යම් ගැටළුකාරී තත්වයක් අප හමුවේ පවතී. ( මෙම නිලධාරීන් සඳහා යෝජිත බඳවා ගැනීම් පටිපාටිය තවම අනුමත වී නොමැති නිසා) එසේම අදාල තොරතුරු රැස් කිරීමේ දී එක් එක් සේවා කාණ්ඩයට අදාලව මෙන්ම දෙපාර්තමේන්තුවේ අංශ අදාල කරගනිමින් මෙම කාර්යය සිදු කිරීමට විය. අප දෙපාර්තමේන්තුවේ වැඩිම සේවක පිරිසක් ක්ෂේත්‍ර නිලධාරීන් (මුළු සේවක පිරිසෙන් 548 ක් ක්ෂේත්‍ර නිලධාරීන් වේ) වන අතර ඔවුන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති බැවින් ඔවුන්ට අවශ්‍ය පුහුණු වැඩසටහන් සම්බන්ධ තොරතුරු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙන්වා ගත යුතු වේ. එම තොරතුරු රැස් කිරීම සඳහා යම් කාලයක් අපට අවශ්‍යව තිබුණි.<br>ඒ අනුව අදාල තොරතුරු අප විසින් රැස් කරමින් පවතින අතර අදාල මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |